යම් වරදකට ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම අත්අඩංගුවට ගත් විටක, එකී වරදට චෝදනා ලබන කාන්තා පාර්ශවය පමණක් ඉස්මතු කරමින් පුවත් වාර්තා පළ වීම මාධ්‍ය තුළ නිතර දක්නට ලැබේ.

"වික්ටෝරියාවයි - හමුදා කඳවුරයි වීඩියෝ කළ දෙන්නා කොටු වෙයි" මැයෙන් ලංකාදීප පුවත්පතේ (15/11) වාර්තා වූ පුවත ඊට උදාහරණයකි. වික්ටෝරියා වේල්ල ප්‍රදේශය සහ ඒ ආසන්නයේ ඇති යුද හමුදා කඳවුරක් වීඩියෝගත කරමින් සිටි "කාන්තාවක් ඇතුළු දෙදෙනෙකු" සැකපිට අත්අඩංගුවට ගෙන ඇති බව, එහි අන්තර්ගතයෙහි සඳහන් විය.

මෙම පුවතම, ද අයිලන්ඩ් පුවත්පත (15/11) වාර්තා කරන්නේ, "පිරිමින් දෙදෙනෙකු සහ කාන්තාවක" (two men and a woman) අත්අඩංගුවට ගත් බව පවසමිනි.

ඒ අනුව,

1) මෙහිදී කාන්තාවන් ඉස්මතු කොට සඳහන් කරන්නේ, එකම වරදක් කාන්තාවන් සහ පිරිමින් සිදු කළ විටකදී පවා, කාන්තාවන්ට එම වරදේ වැඩි වගකීමක් පැවරෙන බවක් පෙන්වීමට යැයි ඔබ සිතන්නේද?

2) එහිදී කාන්තාව සෘණාත්මක ලෙසින් ඉස්මතු වීමක් සහ ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කොන් කිරීමකට ලක් වීමක් සිදු නොවන්නේ ද?

3. එසේ නම්, "කාන්තාවක් ඇතුළු දෙදෙනෙකු" වැනි සඳහන් කිරීම් වෙනුවට, "පිරිමින් දෙදෙනෙකු සහ කාන්තාවක" වැනි, ස්ත්‍රී පුරුෂ භාවය ඔස්සේ කාන්තාව සෘණාත්මකව ඉස්මතු නොකෙරෙන සඳහන් කිරීම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

ඔබේ අදහස කුමක්ද?